# අධ්‍යාපනය මඟින් දරුවා තුළ වර්ධනය කළයුතු මූලික නිපුණතා

**යූ. එම්. යමුනා සේනානි**

*ශිශෙප් විද්‍යාලය, කොළඹ*

---

මෑත කාලීනව විෂය නිර්දේශය සකස් කර ඇත්තේ නිපුණතා පාදක ප්‍රවේශයකිනි. නිපුණතා පාදක නව විෂය නිර්දේශයට අනුව අධ්‍යාපන ක්‍රියාවලියේ දී පහත දැක්වෙන නිපුණතා දරුවා තුළ වර්ධනය කළ යුතුය.

1. සන්නිවේදන නිපුණතා
2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා
3. පරිසරයට අදාළ නිපුණතා
4. වැඩ ලෝකයට සූදානම්වීමේ නිපුණතා
5. ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
6. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
7. "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

## සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අංග මත සන්නිවේදන

නිපුණතා පදනම් වේ. ඒ ඒ අංශ යටතේ හඳුනාගන්නා නිපුණතාවයන් මතු දක්වෙන පරිදි පෙළගැස්විය හැකිය.

සාක්ෂරතාව යටතේ සාවධානව ඇහුම්කන්දීම, පැහැදිලිව කථාකිරීම, තේරුම්ගැනීම සඳහා කියවීම නිවැරදිව සහ නිරවුල්ව ලිවීම හා ඵලදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම වැනි නිපුණතාවයන් ලබා ගතයුතු ය.

භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය යන නිපුණතාවයන් සංඛ්‍යා පිළිබඳ දැනුම යන අංශය මගින් ඉලක්ක වේ. තවද, රූපක භාවිතය යන්නෙන් දක්වන්නේ රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා ආකෘති වර්ණ ගලපමින් විස්තර උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම යි. තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය ලෙස පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයන් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම හා ඊට අදාළ අනෙකුත් නිපුණතා අදහස් වේ.

## පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා ද සැදු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරුකිරීම වැනි අගයයන් හා චිත්තවේගී බුද්ධිය යන දෑ අදහස් වේ.

## පරිසරයට අදාළ නිපුණතා

පරිසරයට අදාළ නිපුණතා සාමාජීක, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ. එයින් සමාජ පරිසරයට අයත් වන්නේ ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා භෞතික සම්ප්‍රදායයන් අයිතිවාසිකම් වගකීම් යුතුකම් සහ බැඳීම් ය.

ජෛව පාරිසරික නිපුණතා වන්නේ සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා ය.

අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුවපහසුව, නින්ද, නිස්කලන්කය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය සංවේදීතාව හා කුසලතාව යනාදිය භෞතික පරිසරයට අදාළ වේ. ඒ අනුව පරිසරයට අදාළ නිපුණතා යටතට ඉගෙනීම, වැඩකිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා අඩංගු වන බව පැහැදිලි ය.

## වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායකවීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවන් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරතවීම, මෙම හැකියාවන් උපරිම කිරීමට හා

ධාරිතාව වැඩිකිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා මේ යටතේ දැක්වේ.

## ආගම් සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේදී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම යන නිපුණතා මෙම වර්ගීකරණය යටතට අදාළ වේ.

## ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්ය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම් මෙම වර්ගයේ නිපුණතා මගින් දැක්වේ.

## "ඉගෙනුමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

සීග්‍රයෙන් වෙනස්වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියත් හරහා වෙනස්වීම් හඳුරුවා ගැනීමේදී ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමෙන් ස්වාධීනව ඉගෙන ගැනීමක් සඳහා පුද්ගලයන්හට ශක්තිය ලබාදීම මෙම නිපුණතාවලින් අරමුණු කෙරේ.

ඉහත දක්වන ලද නිපුණතාවලින් පිරිපුන් දරුවෙකු බිහිකිරීම මගින් සංවේදී හදවතක් සහිත සමාජයට වැඩදායී පුද්ගලයෙකු නිර්මාණය වේ. එබැවින් නූතන විද්‍යාත්මක හා තාක්ෂණික ලෝකය තුළ දැනුම සොයා යන දරුවාට නිවැරදි මඟ පෙන්වාදීම ගුරුවරයාගේ වගකීම වේ.

# දේශපාලන හා අධ්‍යාපන විප්ලවයන් කළ ජීන් ජෙක්ස් රූසෝ

ලෝක ඉතිහාසයේ සුවිශේෂ සිද්ධියක් හැටියට 1789 ඇති වූ ප්‍රංශ විප්ලවය සැලකිය හැකිය. දීර්ඝ ඓතිහාසික සංවර්ධනයක ප්‍රතිඵලයක් වන එම සිදුවීමට චින්තනය සකස් කළ දාර්ශනිකයන් අතර ජීන් ජෙක්ස් රූසෝට සුවිශේෂ වැදගත් ස්ථානයක් හිමිවේ. අධ්‍යාපන ඉතිහාසයේද අමතක නොවන මොහුගෙන් සිදුවූ මෙහෙවර අංශ 2 ක් ඔස්සේ අපට සාකච්ඡා කළ හැකිය.

1. ප්‍රංශ දේශපාලන චින්තනය සකස්කිරීමෙහිලා සිදුවූ සේවය.

2. අධ්‍යාපනඥයකු ලෙස සිදුවූ සේවය.

ප්‍රංශ විප්ලවය උදෙසා ඔහුගේ සේවය සාකච්ඡා කිරීම වැදගත් වේ. ප්‍රංශ විප්ලවය මූලිකව රදල ප්‍රංශය නූතන ප්‍රංශය බවට පත් කිරීමට ගත් ප්‍රයත්නයකි. මේ විප්ලවය සඳහා මානසික පසුබිම සැකසුමට පුරෝගාමී චින්තකයන් වූවේ රූසෝ, වෝල්ටෙයාර් සහ මොන්ටෙස්කියු. මෙම විප්ලවයේ තේමාව වූවේ "නිදහස සමානත්වය හා සහෝදරත්වයයි. මිනිස් නිදහස හා සමානත්වය අගය කළ රූසෝ මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව ද විශ්වාසයෙන් යුතුව කටයුතු කළේය. මේ බව සනාථවන්නේ "මිනිසා නිදහස්ව උපදිතත් ඔහු හැම තැනකදීම යදමවලින් බැඳී ඇත. (MAN IS BORN FREE AND EVERYWERE HE IS IN CHAIN) යන ප්‍රකාශයෙනි. යහපත් සමාජයක් බිහිකිරීම සඳහා ඔහුගේ දර්ශනයේ අරමුණු 2 ක් විය.

1. මිනිසා නිදහස හා සමානාත්වය ගරු කරන දේශපාලන ධර්මයක්.

2. ස්වභාව ධර්මයට අනුකූල අධ්‍යාපනයක්.

ප්‍රංශ විප්ලවයට පෙර ප්‍රංශ දේශපාලනය ගිණෝඩින් හා ජැකොබින් යන පක්ෂ දෙක යටතේ සංවිධානය වූ අතර ජැකොබින් ධර්මය ගොඩ නැගුනේ රූසෝ විසින් "සෝෂල් කන්ට්‍රැක්ට්" (සමාජ සම්මුතිය) නම් ග්‍රන්ථයේ පළකර තිබූ අදහස් අනුවය. ඔහුගේ අදහස් අනුව රටක ස්වාධිපත්‍ය හිමිවිය යුත්තේ ජනතාවගේ පොදු මතයටය. මෙය ගැඹුරු දේශපාලන ධර්මයකි. කෙසේ වෙතත් ප්‍රංශ විප්ලවයට පසබිම් වූ චින්තනය හැඩගැස්වීම සඳහා රූසෝගෙන් ඉටු වූ සේවය අමතක කළ නොහේ.

රූසෝගේ අධ්‍යාපන දර්ශනය ගැන සාකච්ඡාවට පෙර ඔහුට පසුබිම් වූ සමාජ තත්ත්වය පරීක්ෂා කළ යුතුය. ප්‍රංශ විප්ලවයට පසුබිම් වූ දේශපාලන පසුබිමේ තිබූ පවුල, පල්ලිය, රජය යන සියලුම ආයතන ඒකාධිපති බලවේගය විසින් ග්‍රහණය කර ගෙන තිබිණි. ඔහුගේ අදහසට අනුව එකල ප්‍රංශයේ වූයේ විකෘති සමාජයකි. මිනිසා පීඩනයට පත් කළ එම පසුබිම තුළ රූසෝගේ ළමා විය ද දැඩි සේ පීඩනයට ලක් විය. ඔහු කුඩා කල මව මියගිය අතර පියාට පුතුගේ දක්ෂතා වර්ධනය කිරීමට හැකියාවක් නොවීය. ඔහුගේ ඥතීන් ද ඔහුට ඉගැන්වීම කළේ ආචාටගියාටය. මෙම දුක්ඛිත ළමා වියත් එකල තිබූ දූෂිත සමාජයක් පිළිබඳ ඔහු තුළ වූ කලකිරීම ඔහුගේ අධ්‍යාපන දර්ශනයට පසුබිම් විය. ඔහුගේ අධ්‍යාපන චින්තනය අපට අවබෝධවන්නේ ළමා චරිත ලක්ෂණ විස්තර කිරීමට හා විග්‍රහ කිරීමට රචනා කළ "එමිල්" EMILE යන කෘතියෙනි.

අධ්‍යාපන හා දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රගතිශීලී මුහුණුවරක් දුන් රූසෝ 1712 දී ජිනීවා නුවර දුගී පවුලක උපත ලැබීය. ඔරලෝසු කාර්මිකයකුට දාව ස්විස් ජාතික කාන්තාවකගෙන් උපත ලද ඔහු ගත කළේ දුක් කම්කොටලුවලින් පිරුණු ජීවිතයකි. ලිපිකරුවකු ලෙස, කැටයම්කරුවකු ලෙසද කලක් කටයුතු කළත් ඒ කිසිවක් සාර්ථක නොවීය. 1728 දී ජිනීවා අත්හැර ප්‍රංශයට ගිය අතර ඔහුගේ ජීවිතයේ වැදගත් වෙනස්වීම් එහිදී සිදු විය. 1750 දී එනම් තම වයස අ. 38 දී ඔහු විසින් රචනා කරන ලද DISCOURSE OF THE INFLUCNCE OF LEARNING AND ART නම් කෘතිය ඔහුගේ ජීවිතයේ පෙරළියක් ඇති කළේය. මේ කෘතියෙන් ඔහුගේ ලේඛන දිවිය අවදි වූ බව පෙනේ. "එමිල්" කෘතිය කිතු දහමට වැදුණු මරු පහරක් විය. මිනිසා උපතින්ම පව්කාරයකු නොවන බවද ඔහු යහපත් අයකු බවද ඔහු සමාජය හා ගැටෙන නිසා පව්කාරයකු වන බවද ඔහු පවසයි. දරුවා දුක්ඛිත තත්ත්වයෙන් බේරීමට මිනිස් සමාජයේ බලපෑමෙන් තොර අධ්‍යාපනයක් ඔහුට දිය යුතු බව පොහොම අවධාරණය කරයි. පාපයට එරෙහිව සෘජුවම ලියන ලද්දක් සේ "එමිල්" සැලකූ සමහරු එය ගිනිබත් කළ අතර සමහර ප්‍රදේශවල එය තහනම් කරනු ලැබ ඇත.

"එමිල්" ග්‍රන්ථය කොටස් 5 ක් යුක්තවේ. දරුවකුගේ උපතේ සිට තරුණවිය දක්වා කාලය කොටස් 4 කට බෙදූ ඒ ඒ යුගවල දිය යුතු අධ්‍යාපනය ඒ ඒ කොටස් 4 න් ද, 5 වන කොටසින් එමිල්ගේ කල්පිත බිරිය වූ සොෆියාට දිය යුතු අධ්‍යාපනය ද විස්තර කරයි. ළමයකුගේ අධ්‍යාපනය උපතේ සිටම දියයුතු බව ප්‍රකාශ රූසෝ එය ඔහුගේ ස්වාභාවික වර්ධනයට අනුව විය යුතු බවද පෙන්වා දෙයි. ඉන්ද්‍රිය වර්ධනය සිදුවන මේ අවධියේ ළමයාට නිතරම ප්‍රීතියෙන් කල්ගෙවීමටත් ඒ ස්වාභාවිකව වැඩීමටත් අවස්ථාව සැලසීමේ අගය මතුකර ඇත. "නිරෝගී සිරුරක නිරෝගී මනසක්" ඇති බව දක්වන රූසෝ ග්‍රීක දර්ශනිකයකු වූ ප්ලේටෝ යුගයේ කායික අධ්‍යාපනයේ අගය ද විදහා දක්වයි. ළමයාට ළමයකු ලෙස වැඩීමට ඉඩදීම, සොබාදහම හා භාණ්ඩ සම්බන්ධකර අධ්‍යාපනය දීම පිළිබඳව ඔහු අවධාරණය කර ඇත. අ. 12 - 15 පූර්ව නව යෞවන යුගයේදී ක්‍රියාකාරකම් හා අත්දැකීම්වල අගය මතුකරන රූසෝ කෘෂි කර්මාන්තය හා හස්ත කර්මාන්තය ආදිය මේ යුගයේ උගත යුතු බව දක්වයි. මේ යුගයේදී ආත්ම විශ්වාසය ගැන හැඟීමක් ඇති කළ යුතු නිසා රොබින්සන්කෘසෝ ආදී පොත්පත් පාඨ ග්‍රන්ථ ලෙස උචිත බව දක්වා ඇත. හතරවන කොටසින් අ. 15 - 20 වන යෞවන යුගයේ ලිංගික ලෙස ලබන දෙවන උපතක් සේ දක්වන රූසෝ මේ යුගයේ කෙනකුගේ සදාචාර හැඟීම් පිබිදෙන යුගයක් ලෙස දක්වා ඇත. මනෝවිද්‍යාව සමාජ විද්‍යාව ආචාරවිද්‍යාව ආදී විෂයයන් මේ යුගයේදී අධ්‍යාපනයට අඩංගු විය යුතු බවද දක්වා ඇත. මේ යුගයේදී ඉතිහාසය ද ඉගැන්විය යුතු අතර රස වින්දනය උදෙසා සංගීතය නාට්‍ය කලා අවබෝධය ද ලබාදිය යුතුය.

"එමිල්" ග්‍රන්ථයේ අවසාන කොටසින් රූසෝගේ අධ්‍යාපනය පිළිබඳ අදහස් පලවේ. එමිල් ක්‍රමයෙන් යෞවනත්වයට පත් කරන රූසෝ ඔහුගේ සහකරු බවට සොෆි නම් අයෙක් ඉදිරිපත් කරයි. ඇය ලද කාන්තා අධ්‍යාපනය මේ කොටසින් දක්වන අතර විවාහ දිවියට අවශ්‍ය අංග හා ස්වාමි භාර්යයා සබඳතා පිළිබඳ කාන්තාවක සතු යුතුකම් පැහැදිලි කරයි. කාන්තාවකට ආරම්භයේ සිටම ආගමික අධ්‍යාපනයක් දීමට රූසෝ නිර්දේශ කරයි. රාජ්‍ය හා සමාජ බලපෑමෙන් තොරව අධ්‍යාපනය දීමට රූසෝ අදහස් කරන්න ඇත්තේ ප්‍රංශ විප්ලවයට පෙර රජය හා සමාජය දූෂණයවීම හා ඒ ආයතන දෙක කෙරේ ඔහු තුළ පැවති කලකිරීම නිසාය. එහෙත් "පෝලන්ත රාජ්‍ය විභාගය" යන කෘතියෙන් කාන්තා අධ්‍යාපනය රජයේ ප්‍රධාන කාර්යය විය යුතු බවද රාජ්‍ය පරමාර්ථ ඉටුවන ලෙසම සෑම පුරවැසියෙකුටම මහජන ආයතන හා ප්‍රජා යුතුකම් පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතු බවද පවසා ඇත. ජනතාවට ජාතහානුරාගී අදහස් කාවැද්දීමට රජය ඉදිරිපත් විය යුතු බවද ඔහු මේ තුළින් අවධාරණය කරයි.

ලෝකයේ දේශපාලන හා ප්‍රගතිශීලී අධ්‍යාපන විප්ලවයටත් මගපෑදූ අධ්‍යාපනය පිළිබඳ අදහස් එදා සිටි උගතුන්ගේ දර්ශනයට ලක්වුවද අධ්‍යාපන ක්ෂේත්‍රයේ විප්ලවයක් ඇති කිරීමට එම චින්තනය හේතු විය. අදත් අධ්‍යාපන විද්‍යා පාඨමාලා සහ එම ක්ෂේත්‍රයේ දැනුවත් කිරීම් සඳහා රූසෝගේ සිද්ධාන්ත සෑම රටකම පාහේ භාවිතයට ගැනේ. නූතන පුරෝගාමීන් අතර ඔහුට හිමිවන ස්ථානය අගය කළ යුතුය. අතීතයේදී ශික්ෂකයාට වඩා ප්‍රධාන ස්ථානයක් හිමි වූයේ උගන්වන විෂයට වුවද ඊට වඩා ශිෂ්‍ය අවශ්‍යතාවලට හා කුසලතාවලට ප්‍රධාන තැන දිය යුතු බවද, ස්වාභාවධර්මය විසින් දී ඇති නිදහස ලබාදිය යුතු බවද ඔහු පෙන්වා දෙයි. විනය ගැනද දැඩි අවධානයක් දක්වන ඔහු දඬුවම හෝ තාඩන පීඩන මගින් විනය ඇති කිරීම ප්‍රතික්ෂේප කරයි. ආත්ම දමනයෙන් වන ස්වයං හික්මීම වැදගත් වන බවද හේ ප්‍රකාශ කරයි. පෞද්ගලික නිදහසට ගරු කිරීමේ අගය රූසෝගේ අධ්‍යාපන හා දේශපාලන යන දර්ශන දෙකේදීම මතුකර ඇත. මේ අනුව ළමා ලොවට නිදහස උදාකළ අධ්‍යාපනඥයකු ලෙස සුවිශේෂී ස්ථානයක් ඔහුට හිමි වේ.

ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය උපයෝගී කරගෙන ළමයින්ට යම් යම් අත්හදා බැලීම් කිරීමට අවස්ථාව ලබාදිය යුතු බව දක්වන ඔහු ළමුන්ට පර්යේෂණ මගින් ඉගැන්වීමේ අවස්ථා උදා කළ යුතු බවද පෙන්වා දී ඇත. ළමාවියේ සිට කෙනකු ශිල්පීය අධ්‍යාපනයට හුරුකිරීමෙන් ඔහු අදහස් කළේ අතත් හිතත් පෝෂණය කිරීමටය. තම බුද්ධියෙන් හා ශක්තියෙන් ජීවනෝපාය ලැබීමට අවස්ථාව ලබාදීම ඔහු සිය අධ්‍යාපනයෙන් ලබාදුන් එක් අරමුණකි. "මගේ අරමුණ එමිල්ට අධ්‍යාපනය ලබාදීම නොව ඊට අවශ්‍ය මාර්ග හෙළි කිරීමය" යි හේ ප්‍රකාශ කර ඇත. අධ්‍යාපනය මගින් ඔහු අපේක්ෂා කළේ උසස් ගුණාංගයෙන් යුක්ත උසස් ධාර්මික මනුෂ්‍යයකු බිහි කිරීමය.

රූසෝගේ අධ්‍යාපන විද්‍යාවට ඇතුළත් කරුණු තුළ දුර්වලතා දක්නට නැත්තේ නොවේ. එහි ප්‍රධාන දුබලතාව නම් ස්වාභාවධර්මය (NATURE) යනුවෙන් අදහස් කරන දෙය විග්‍රහ නොකිරීමය. තවත් දුබලතාවක් නම් පවුල හා ඒ තුළින් ඔහුට ලැබෙන ආදරය ආරක්ෂාව හා සුරක්ෂිත බව මගින් ළමා අධ්‍යාපනයට සිදුවන බලපෑම අමතක කිරීමය. සමබර පෞරුෂයක් සඳහා වැඩිහිටි ආදරය හා පවුලේ සුහද බවද අවශ්‍ය වේ. රූසෝගේ ළමා වියේ අමිහිරි අත්දැකීම් නිසාදෝ මෙය පැහැදිලි කිරීමට හේ අසමත් වී ඇත. එසේම එය ඓතිහාසික පසුබිමෙන් තොරවීම ද තවත් අඩුපාඩුවකි.

කාලදේශානුරූපව 21 වැනි සියවසට උචිත අධ්‍යාපනයක් සැකසීමට ප්‍රයත්නයක යෙදෙන ශ්‍රී ලාංකික අපට රූසෝ චින්තනය කදිම මාර්ගෝපදේශයකි. දේශානුරාගය ඇතිකරන විනය ගරුක සමබර පෞරුෂයක් ඇතිකරන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් පිළිබඳ එහි අවධාරණය කර ඇත. දේශපාලන හා අධ්‍යාපනික වශයෙන් ලෝක ඉතිහාසයට මහඟු සේවයක් ඉටු කළ, චින්තන විප්ලවයක් කළ ජීන් ජැක්ස් රූසෝ 1778 ජූලි 28 දින මෙලොවින් සමුගත්තේ ලෝක ඉතිහාසයේ නොමැකෙන සිහිවටනයක් සනිටුහන් කරමිනි.